# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2143/3 - 2019 සැප්තැම්බර් මස 30 වැනි සඳුදා - 2019.09.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත**

2 වැනි වගන්තිය යටතේ නියමය

2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් අමාත්‍ය මංගල සමරවීර වන මම, මෙහි උපලේඛනයේ I වන තීරයේ නිශ්චිතව දක්වා ඇති වෙළඳ භාණ්ඩ සම්බන්ධයෙන් ඒ උපලේඛනයේ II වන තීරයේ අනුරූප සටහන් වල නිශ්චිතව දක්වා ඇති අනුප්‍රමාණ මත විශේෂ වෙළඳ භාණ්ඩ බද්දක්, මෙම නියමය මගින් පනවමි.

මෙම නියමය 2019 ඔක්තෝබර් මස 01 වැනි දින සිට ආරම්භ වන වසරක කාල සීමාවක් සඳහා, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන වලට යටත්ව, වලංගුව පැවතිය යුතු ය.

මංගල සමරවීර,
මුදල් අමාත්‍ය.

2019 සැප්තැම්බර් මස 30 වැනි දින,
කොළඹ 01,
මුදල් අමාත්‍යාංශයේ දී ය.

**උපලේඛනය**

| *I වැනි තීරය* | | | | *II වැනි තීරය* |
|---|---|---|---|---|
| *වෙළඳ භාණ්ඩය* | | | | |
| | *සං. ව. ශීර්ෂය* | *සං. ව. සංකේතය* | *විස්තරය* | *විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද* |
| 01. | 03.02 | | 03.04 ශීර්ෂයේ කටු ගැලවූ මසුන් සහ අනෙකුත් මසුන්ගේ මස් හැර, අළුත් හෝ ශීතකළ මසුන් | 10% හෝ කි. ග්‍රෑමයට රු. 100 යන දෙකෙන් වඩා වැඩි බදු ප්‍රමාණය |
| | 03.03 | | 03.04 ශීර්ෂයේ කටු ගැලවූ මසුන් සහ අනෙකුත් මසුන්ගේ මස් හැර, හිමායිත මසුන් (රේග සං.ව. සංකේතාංක 0303.54 යටතට වැටෙන මැකරල් මසුන් හැර) | 10% හෝ කි. ග්‍රෑමයට රු. 100 යන දෙකෙන් වඩා වැඩි බදු ප්‍රමාණය |
| 02. | 04.03 | 0403.10 | යෝගට් | කි. ග්‍රෑමයට රු. 625 |
| | | 0403.90 | අනෙකුත් | කි. ග්‍රෑමයට රු. 625 |



මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

උපලේඛනය (සම්බන්ධිතයි)

| I වැනි තීරය | | | | II වැනි තීරය |
|---|---|---|---|---|
| වෙළඳ භාණ්ඩය | | | | |
| | සං. ව. ශීර්ෂය | සං. ව. සංකේතය | විස්තරය | විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද |
| 03. | 04.05 | 0405.10 | වෙඩරු | කි. ග්‍රෑමයට රු. 880 |
| | | 0405.20 | කිරි වලින් නිපදවූ තැවරුම් | කි. ග්‍රෑමයට රු. 880 |
| | | 0405.90 | අනෙකුත් | කි. ග්‍රෑමයට රු. 880 |
| 04. | 07.03 | 0703.20 | සුදු ළූනු | කි. ග්‍රෑමයට රු. 40 |
| 05. | 08.06 | 0806.10 | මිදි - අළුත් | කි. ග්‍රෑමයට රු. 130 |
| 06. | 09.10 | 0910.99.10 | උළුහාල් ඇට | කි. ග්‍රෑමයට රු. 50 |
| 07. | 11.02 | 1102.90.20 | කුරක්කන් පිටි | කි. ග්‍රෑමයට රු. 150 |
| 08. | 12.02 | 1202.42 | රටකජු - පොතු හරින ලද | කි. ග්‍රෑමයට රු. 112 |
| 09. | 12.07 | 1207.50 | අබ ඇට | කි. ග්‍රෑමයට රු. 62 |
| 10. | 25.01 | 2501.00 | ජලීය ආකාරයේ හෝ එසේ නොවන ආකාරයෙන් වූ හෝ එකතු කරන ලද කැටි නොගැසී මේ කාරකයෝ නිදහසේ පාවීම සඳහා වන ද්‍රව්‍යයන් අඩංගු වන්නාවූ, ශුද්ධ සෝඩියම් ක්ලෝරයිඩ් හෝ ලුණු (මේස ලුණු සහ ස්වභාවික තත්ත්වය වෙනස් කළ ලුණු ඇතුළුව) මුහුදු ජලය | කි. ග්‍රෑමයට රු. 40 |

10 - 535

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.